**අ.පො.ස. (සා.පෙළ)**

# විද්‍යාව

**10 ශ්‍රේණිය**

# 08 - ජීවීන්ගේ ලාක්ෂණික









**වසන්ත වන්නිආරච්චි**

**Dip in Teach. Sc., B. Ed.**

- බාහිර ලක්ෂණ පමණක් පදනම් කරගෙන ජීවී බව පිළිබඳව ස්ථිර නිගමනයකට එළඹිය නොහැක.
උදා:- කිකිළි බිත්තරයක් සජීවී ලක්ෂණ නොපෙන්වුවද එය රැක්ක පසු සජීවී ලක්ෂණ පෙන්වන ජීවියෙකු බිහිවේ.

- යම් වස්තුවක් ජීවියෙකු වීමට පෙන්විය යුතු ලක්ෂණ ලැයිස්තු ගත කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | ........................................................ | 5. | ........................................................ |
| 2. | ........................................................ | 6. | ........................................................ |
| 3. | ........................................................ | 7. | ........................................................ |
| 4. | ........................................................ | 8. | ........................................................ |

## 1. සෛලීය සංවිධානය

- සියලුම ජීවීන්ගේ දේහ ................................................ වලින් තැනී ඇත.
- ඒක සෛලික ජීවීන්ගේ දේහය ........................................ තැනී ඇති අතර එම සෛලය තැනී ඇත්තේ සෛල ප්ලාස්මය තුළ ඇති ......................................, .......................................... පටලයෙන් වටවීමෙනි.
- ඒක සෛලිකයින්ගේ ............................... මට්ටමේ සංවිධානයක් ඇත.
උදා:- (i) ................................. (ii) ................................. (iii) .................................
- පොකුණු ජල සාම්පලයක් අන්වීක්ෂයෙන් නිරීක්ෂණය කිරීමෙන් .............................................. යන ක්ෂුද්‍රජීවී කාණ්ඩය හඳුනා ගත හැක.
- බහු සෛලික ජීවීන් ගේ දේහ ද ආරම්භ වී ................................................ හා ............................................... සම්බන්ධ වී සෑදෙන .............................................. කිනි.




- බහු සෛලික ජීවියෙකුගේ දේහයේ සංවිධාන මට්ටම් පහත පරිදි ගැලීම් සටහනකින් පෙන්විය හැක.

[ ] → සජීවී තත්වයේ පවතින කුඩාම ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය යි.
↓
[ ] → පොදු සම්භවයක් සහිත, නිශ්චිත කාර්යයන් ඉටු කිරීම සඳහා විශේෂණය වූ සෛල සමූහයකි.
↓
[ ] → පටක කිහිපයක් එකතු වීමෙන් සෑදෙන ව්‍යුහයයි.
↓
[ ] → ඉන්ද්‍රිය / අවයව කිහිපයක එකතුවකි.
↓
[ ] → පද්ධති කිහිපයක එකතුවකි.

## 2. පෝෂණය

- ජීවය පවත්වාගෙන යාම සඳහා ......................................... හා ......................................... ලබාගැනීමේ ක්‍රියාවලියයි.
- පෝෂණයේ ආකාර 2කි.
- i) ...................................................... පෝෂණය - පෝෂක ද්‍රව්‍ය තමා තුළම නිපදවා ගනී.

- ii) ..................................................... පෝෂණය - තම පෝෂණ අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ශාක තුළ නිපදවූ ආහාර හෝ වෙනත් ජීවී සම්භවයක් ඇති කාබනික ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනී.
- ආහාර නිෂ්පාදනයට භාවිතා කරන ......................................................... ආකාරය පදනම් කරගනිමින් ස්වයංපෝෂීන් ප්‍රධාන කොටස් 2කට බෙදයි.
  1. ................................................................. - සූර්ය ශක්තිය භාවිතාකරයි. උදා: ..........................................
  2. ................................................................. - රසායනික ප්‍රතික්‍රියා මගින් ශක්තිය නිපදවා ගනී.

     උදා: ...................................................................
- ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැක.
  1. සිදුවන ස්ථානය :-.......................................................................................................
  2. ශක්ති ආකාරය :-.......................................................................................................
  3. අමුද්‍රව්‍ය :-.......................................................................................................
  4. ප්‍රධාන ඵලය :-.......................................................................................................
  5. අතුරු ඵලය :-.......................................................................................................
- **ප්‍රභාසංස්ලේෂණයෙහි වචන සමීකරණය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | + | | → | | + | |

- **ප්‍රභාසංස්ලේෂණයේ තුලිත රසායනික සමීකරණය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | + | | → | | + | |

- ................................................ තුළ ආහාර ලෙස ගබඩා වන සූර්ය ශක්තිය ආහාර දාම ඔස්සේ ආහාර ලෙසින් ඉහළ පුරුක්වල සිටින ................................... ලැබේ.

## 3. ශ්වසනය

- ජීවී සෛල තුළ දී සංචිත ආහාර මගින් ....................................... නිපදවීමේ ක්‍රියාවලිය ''සෛලීය ශ්වසනය'' යි.

**ශ්වසනයේ දී $CO_2$ වායුව පිටවන බව පරීක්ෂණාත්මකව පෙන්වීම.**




A පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් | B හුනු දියර | C මැඩියා | D හුනු දියර | E ජලය

Q) ඉහත එක් එක් නලයේ කාර්යය කුමක් ද?

A) A - වාතයේ ඇති $CO_2$ වායුව අවශෝෂණය.

B - එම නලයට ලැබෙන වාතයේ $CO_2$ නොමැති බව තහවුරු කිරීම

C - ජීවියාගේ ශ්වසනයට ඉඩ හැරීම.

D - ශ්වසනයේදී $CO_2$ පිටවූ බව හඳුනා ගැනීම.

E - ඇටවුම ඔස්සේ වායු ධාරාවක් ඇදී යාමට සැලැස්වීම.

- ඉහත ක්‍රියාකාරකමේ දී C බඳුනට සත්වයෙකු වෙනුවට ප්‍රරෝහණය වන බීජ යොදා ගත හැක. එහි දී පාලක ඇටවුම ලෙස එම වර්ගයේම ............................................ යෙදූ ඇටවුමක් යොදාගත හැක.

**ශ්වසනයේ දී $O_2$ වායුව අවශෝෂණය කරන බව පරීක්ෂණාත්මක පෙන්වීම.**




- ඉහත ක්‍රියාකාරකමේ දී A ඇටවුමේ වර්ණ කළ ජල බඳුනේ ගිල්වූ වීදුරු නළය තුළ ද්‍රව මට්ටම ඉහළ යන නමුත් B ඇටවුමේ එසේ නොවේ. එයට හේතුව A ඇටවුම තුළ ඇති ප්‍රරෝහණය වන බීජ සෛලීය ශ්වසනයේ දී පිටකරන $CO_2$ වායුව පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් (KOH) මගින් අවශෝෂණය කර ඇත. මේ නිසා අවශෝෂණය වූ $O_2$ ප්‍රමාණය අනුව වීදුරු නලය ඔස්සේ ද්‍රව කඳ ඉහළ යයි.
- නමුත් B ඇටවුමේ $CO_2$ පිටවන වේගයට $O_2$ අවශෝෂණය වීමේ වේගය සමාන නිසා ජල මට්ටම ඉහළ නොයයි.
- සතුන් තුළ ........................................ දැකිය හැකි නමුත් ශාක තුළ ........................................................ දැකිය නොහැක.

## 4. උද්දීප්‍යතාව හා සමායෝජනය

- බාහිර හා අභ්‍යන්තර පරිසරවලින් පැමිණෙන උත්තේජවලට ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව ...................................... යි.
- උත්තේජ සඳහා ප්‍රතිචාර දැක්වීමේ දී විවිධ ඉන්ද්‍රියයන් අතර සම්බන්ධීකරණය .......................................... යි.
- සමායෝජනය සඳහා ................................. , ...................................... හා ...................................... වැදගත් වේ.
- සතුන් පමණක් නොව ශාක ද උත්තේජවලට ප්‍රතිචාර දක්වයි.

  උදා:- ....................................................... ගසක් ස්පර්ශ කළ විට එහි පත්‍ර හැකිලීම.
- පරිසරය තුළ සිදුවන අපට සංවේදී වන වෙනස්වීමක් ............................................. නම් වේ.
- උත්තේජයක් සඳහා අපගේ සිරුර දක්වන ප්‍රතික්‍රියාව ............................................. නම් වේ.
- උත්තේජ ලබා ගන්නා සංවේදී ඉන්ද්‍රිය 5 කි.

1. .......................................... 3. .......................................... 5. ....................................

2. .......................................... 4 ..........................................

## 5. බහිස්‍රාවය

- ..................................... ක්‍රියාවල දී නිපදවන සිරුරට ...................................................... සිරුරෙන් බැහැර කිරීම .................................. යි.
- ජීව සෛල තුළ සිදුවන සියලුම ජීව ක්‍රියා පොදුවේ ............................................................ නමින් හඳුන්වයි.

| බහිස්‍රාවී ඉන්ද්‍රිය | බහිස්‍රාවී ද්‍රව්‍ය | බහිස්‍රාවී ඵල |
|---|---|---|
| | දහඩිය | |
| | මුත්‍රා | ජලය, ලවණ, යූරියා |
| | ප්‍රාශ්වාස වාතය | |

- දේහ සෛල තුළ සිදුවන පරිවෘත්තිය ක්‍රියාවන්ගේ අතුරුඵල ලෙස හටගන්නා නිෂ්ප්‍රයෝජන ද්‍රව්‍ය '' බහිස්‍රාවීය ද්‍රව්‍ය'' යි. නමුත් මළ යනු ආහාර මාර්ගයට ලබාගත් ආහාරවල ශේෂ වූ කොටස් වේ. මේ නිසා මළ බහිස්‍රාවීය ද්‍රව්‍යයක් නොවේ.
- මිනිසාගේ නයිට්‍රජනීය බහිස්‍රාවීය ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් සිදුවන්නේ .................................. මගිනි.
- ශාක ශ්වසනයේ දී නිපදවෙන ........................... වායුව වා සිදුරු සහ පත්‍රවල තිබෙන ............................ හරහා බාහිර වායුගෝලයට නිදහස් කරයි. මෙය ද බහිස්‍රාවීය ක්‍රියාවලියක් වේ.

Q. පහත පද හඳුන්වන්න.

i. සංවෘත්තිය.............................................................................................................

.............................................................................................................

ii. අපවෘත්තිය.............................................................................................................

.............................................................................................................

## 6. චලනය

- ............................., ..........................., ............................ වැනි අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ජීවීන් චලනයන් සිදු කරයි. චලනය වීමක් ලෙස ජීවියාගේ සම්පූර්ණ දේහයස හෝ දේහ කොටසක පිහිටීම වෙනස් කරගනී.
- බහු සෛලික ජීවීන් .................................. ආධාරයෙන් චලනයන් සිදු කරයි.
- බහු සෛලික ජීවීන්ගේ සංචරණ අවයව ..........................., ..........................., ................................
- ඒක සෛලික ජීවීන් ද විවිධ ඉන්ද්‍රියිකා භාවිතයෙන් චලනයන් සිදු කරයි.

උදා: ............................. - ව්‍යාජ පාද

පැරමීසියම් - .............................

ඉවුග්ලිනා - .............................

- යම් ජීවි දේහයක සිදුවන චලනයක් නැවත මුල් තත්වයට පත් නොවේ නම් එය වර්ධක චලනයකි.
  උදා:- ශාක ආලෝකය දෙසට වැඩීම.
- ශාකයක අග්‍රස්ථය .................................... දෙසටත්, මුල් ................................ දෙසටත් වර්ධනය වේ.

Q) ජීවීන්ගේ චලන සඳහා බලපාන උත්තේජ 5ක් නම් කරන්න.

i. ........................ ii. ....................... iii. ....................... iv. ...................... v. .......................

## 7. ප්‍රජනනය

- එක් ජීවි පරම්පරාවක් විසින් තවත් ජීවි පරම්පරාවක් බිහි කිරීමේ ක්‍රියාවලිය .................................... නම් වේ.
- ප්‍රජනනයේ ආකාර 2කි.

1. ........................................................ - පුංජන්මානුවක් හා ජායාජන්මානුවක් සම්බන්ධ වී යුක්තානුවක් සෑදී එය නව ජීවියෙකු දක්වා වර්ධනය වීමයි.

2. ........................................................ - ජන්මානු එක් වීමකින් තොරව ................. ජීවියෙකු විසින් නව ජීවීන් බිහි කිරීමයි.

උදා:- ශාකවල සිදුවන වර්ධක ප්‍රජනනය. බැක්ටීරියාවන්ගේ සිදුවන ඛණ්ඩනය.
අපුෂ්ප ශාකවල සිදුවන බීජානු මගින් බෝවීම.

## 8. වර්ධනය හා විකසනය

- බහු සෛලික ජීවියෙකුගේ ජීවිතය ඇරඹෙන තනි සෛලය ...........................................
- ඒක සෛලික ජීවියෙකුගේ වර්ධනය යනු සෛලයේ ................................. හා ...................................... වැඩිවීමයි.
- බහු සෛලික ජීවියෙකුගේ දේහය තුළ ...................................... මගින් සෛල සංඛ්‍යාව වැඩිවීම දේහ වර්ධනයයි.
- පොදුවේ ඒකසෛලික හෝ බහුසෛලික ජීවියෙකුගේ සෛල වර්ධනය යනු ජීවි සෛලයක ................................ ලෙස වියලි බරෙහි වැඩි වීමයි.
- විකසනය යනු යම් යම් කාර්යයක් ඉටු කිරීම සඳහා සෛල විශේෂීකරණය හෙවත් සෛල ........................................... වැඩිවීමයි.
- වර්ධනය හා විකසනයේ ප්‍රධාන පියවර දක්වන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................

- පැලෑටියක වර්ධන ප්‍රමාණය මැන ගැනීම සඳහා ........................................... භාවිතා කරයි. වෘද්ධිමානයේ කප්පිය සම්බන්ධ කර ඇති .................................. මගින් එහි වර්ධන ප්‍රමාණය විශාල කර දක්වයි.

Q. අජීවී වස්තු ජීවී ලක්ෂණ පෙන්වන අවස්ථා 3ක් නම් කරන්න.

i. ..........................................................................................
ii. ..........................................................................................
iii. ..........................................................................................

### වෛරස

- වෛරස යනු ........................... හා ........................... අතර තත්ත්වයක් ලෙස සලකයි.
- එමෙන්ම වෛරස ........................... ලෙස නොසලකයි.
- වෛරසයක් සෑදී ඇත්තේ ........................... හෝ ........................... යන න්‍යෂ්ටික අම්ල වර්ග 2න් 1ක් පමණක් ........................... කොපුවකින් වටවීමෙනි.
- වෛරසයක් තුළ වෙනත් සෛලීය ඉන්ද්‍රියිකා කිසිවක් නොමැති බැවින් ........................... ක්‍රියා සිදුනොවන නිසා ........................... බවක් පෙන්වයි.
- වෛරස පෙන්වන එකම සජීවි ලක්ෂණය ........................... යි. එය ද සිදු කළ හැක්කේ ......................................................... තුළදී පමණි.
- වෛරස නිරීක්ෂණය කළ හැක්කේ ........................................... අන්වීක්ෂයෙන් පමණි.
- වෛරස නිසා මිනිසාට වැළඳෙන රෝග

♦ ........................................... ♦ ........................................... ♦ ...........................................
♦ ........................................... ♦ ........................................... ♦ ...........................................

- වෛරස නිසා ශාකවලට වැළඳෙන රෝග ♦ .............................. ♦ ........................................

(1) ප්‍රභාසංස්ලේෂණයේ ඵලයක් වශයෙන් ශාක පත්‍රයක පළමුවෙන්ම සෑදෙන්නේ,
1) පිෂ්ට ය  2) ලිපිඩ ය  3) ග්ලූකෝස් ය  4) ප්‍රෝටීන් ය  (1983)

(1) මිනිසාගේ පහත දැක්වෙන ඉන්ද්‍රියයන්ගෙන් බහිස්‍රාවී කෘත්‍යයක් ඉටු නොවන්නේ,
1) පෙණහළු මගිනි  2) වකුගඩු මගිනි  3) සම මගිනි  4) ක්ෂුද්‍රාන්තය මගිනි  (1984)

(2) ජීවියකු තුළ සිදුවන පරිවෘත්තීය ක්‍රියා යනු,
1) ජීවියා තුළ සිදුවන සියලුම සංශ්ලේෂණ ක්‍රියාවලි වේ.
2) ජීවියා තුළ සිදුවන සියලුම රසායනික ක්‍රියාවලි වේ.
3) සංකීර්ණ ද්‍රව්‍ය සරළ ද්‍රව්‍යවලට වියෝජනය වීම වේ.
4) සරල අණුවලින් සංකීර්ණ ද්‍රව්‍ය ගොඩනැගීම වේ.  (1985)

(3) 'බහිස්‍රාවය' යන්නෙහි නිර්වචනය,
1) පරිවෘත්තීය ක්‍රියාවලින් සෑදෙන අපද්‍රව්‍ය පිට කිරීම ය.
2) ජීර්ණය නොවූ ආහාර ද්‍රව්‍ය පිට කිරීම ය.
3) ජලය හා ලවණ වර්ග පිට කිරීම ය.
4) ජල වාෂ්ප හා කාබන්ඩයොක්සයිඩ් පිට කිරීම ය.  (1988)

(4) එක්තරා වායුවක් හුණු දියර තුළින් යැවීමට අවශ්‍ය වේ. ඒ සඳහා සුදුසු ඇටවුම කුමක් ද? ඊතල වලින් දක්වා ඇත්තේ වායුව ඇතුළුවන හා පිටවෙන දිශාවන් වේ. කැකෑරුම් නළ තුල යොදා ඇත්තේ හුණු දියරයයි.




(1988)

(5) යම් කෘමි විශේෂයක ශ්වසනයේ දී $CO_2$ නිපදවේදැයි විමසා බැලීමට විද්‍යාඥයෙකුට අවශ්‍ය විය. X යනු $CO_2$ බුබුළනය කළ විට පැහැය වෙනස්වන දර්ශකයකි. Y යන ද්‍රව්‍යය $CO_2$ අවශෝෂණය කරන ද්‍රව්‍යයකි. ඔහු විසින් පහත දක්වා ඇති අන්දමට පරීක්ෂණ ඇටවුම සකස් කරන ලදි.
පරීක්ෂා නල හතර සකස් කිරීම සඳහා වඩාත්ම සුදුසු සැකැස්ම මින් කුමක් ද?




| | පරීක්ෂා නල 1 | පරීක්ෂා නල 2 | පරීක්ෂා නල 3 | පරීක්ෂා නල 4 |
|---|---|---|---|---|
| 1) | කෘමීන් | Y | X | Y |
| 2) | Y | කෘමීන් | Y | X |
| 3) | Y | X | කෘමීන් | X |
| 4) | X | Y | X | කෘමීන් |

(1996)

(6) පහත සඳහන් ද්‍රව්‍ය අතුරෙන් බහිස්‍රාවීය ද්‍රව්‍යයක් නොවන්නේ කුමක් ද?
1) යූරියා  2) මළ ද්‍රව්‍ය  3) කාබන්ඩයොක්සයිඩ්  4) යූරික් අම්ලය  (1998)

(7) ප්‍රභාසංස්ලේෂණය හා සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **අසත්‍ය** ප්‍රකාශය කුමක් ද?
1) ජලය, ප්‍රභාසංස්ලේෂණය සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍යයකි.
2) ආලෝකය ඇති විට පමණක් ප්‍රභාසංස්ලේෂණය සිදු වේ.
3) ප්‍රභාසංස්ලේෂණය සඳහා හරිතප්‍රද අත්‍යවශ්‍ය වේ.
4) ප්‍රභාසංස්ලේෂණයේ ඵල ලෙස කාබන්ඩයොක්සයිඩ් සහ ග්ලූකෝස් නිපද වේ.  (2010)

(1) අ) ශ්වසන ක්‍රියාවලියේ දී ආහාර වැය වේ. එම ක්‍රියාවලියෙන් ශාකයට ඇති ප්‍රයෝජනය කුමක් ද?

ආ) ප්‍රරෝහණය වන බීජ නියැදියකින් කාබන්ඩයොක්සයිඩ් පිටවන බව පෙන්වීමට යොදා ගත හැකි ඇටවුමක නම් කරන ලද රූප සටහනක් අඳින්න. (1986)




(2) ආශ්වාස වාතයේ ද ප්‍රාශ්වාස වාතයේ ද ඇති කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණ සැසඳීම සඳහා ඇටවුමක් රූපයේ දක්වේ.

අ) C නලයට කට තබා උරන විට වායු බුබුළු දක්නට ලැබෙන්නේ කුමන ජ්ලාස්කුවේ ද? හේතුව පහදන්න.

ආ) මෙසේ කීප විටක් හුස්ම ඉහළ පහළ යැවීමෙන් අනතුරුව ජ්ලාස්කු දෙකේ හුණු ද්‍රාවණවල කවර නිරීක්ෂණ බලාපොරොත්තු විය හැකි ද?

ඉ) පරීක්ෂණයේ ප්‍රතිඵල වශයෙන් ආශ්වාස වාතයේ හා ප්‍රාශ්වාස වාතයේ ඇති කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණ ගැන කුමක් කිව හැකි ද? (1991)

(3) විද්‍යා පරීක්ෂණයක දී පහත සඳහන් A හා B ඇටවුම් දෙක සකස් කරන ලදී. පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් මඟින් වාතයේ $CO_2$ උරා ගනී. පෙ. ව. 10.00 සහ මධ්‍යාහ්න 12.00 දී පාඨාංක ලබා ගන්නා ලදී.




i) A ඇටවුමෙහි තෙල් බිංදුව කෙතරම් දුරක් ගමන් කර ඇත් ද?

ii) තෙල් බිංදුව ගමන් කිරීමට හේතුව කුමක් ද?

iii) මෙම ඇටවුම්වලින් මැනීමට තැත් කරන්නේ කුමක් ද?

iv) B ඇටවුමෙහි කාර්යය කුමක් ද?

v) B ඇටවුමෙහි ද තෙල් බිංදුව ගමන් කිරීමට හේතුව කුමක් ද? (1996)

(4) ශාකවල ප්‍රභාසංශ්ලේෂණය සඳහා අත්‍යවශ්‍ය සාධක ලෙස ආලෝකය, ජලය සහ කාබන්ඩයොක්සයිඩ් ආදිය හැඳින්විය හැකි ය. මෙම සාධක ප්‍රශස්ත ලෙස තබා ගැනීමට ශාක හැඩගැසී ඇත.

අ) ඉහත සඳහන් කර ඇති සාධකවලට අමතරව ප්‍රභාසංශ්ලේෂණයට අවශ්‍ය තවත් සාධකයක් නම් කරන්න.

ආ) ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලියේ දී නිපදවෙන වැදගත් අතුරු ඵලය නම් කරන්න.

ඉ) ප්‍රභාසංශ්ලේෂණ ප්‍රතික්‍රියාව වචන සමීකරණයකින් ලියා දක්වන්න. (2001)

(5) ජීවීන් ඇසුරෙන් හඳුනා ගත හැකි සජීවී බවේ මූලික ලක්ෂණ කිහිපයක් වන්නේ සක්‍රියව චලනය වීම, ශ්වසනය, ප්‍රජනනය, වර්ධනය සහ විකසනයයි. ගෙවත්තේ පරිසර නිරීක්ෂණය කරමින් සිටි සිසුන් පිරිසකට දිරායන කසළ සහිත පරිසරයේ තණකොළ මත සිටින තණකොළ පෙත්තකු නිරීක්ෂණය විය. ඌ හිසේ ඇති ස්පර්ශක පමණක් චලනය කරමින් බොහෝ වේලා නිශ්චලව සිටියේ ය. තෙතමනය සහිත දේහාවරණයක් ඇති කුඩැල්ලකු ද, ගෙම්බකු ද නිරීක්ෂණය විය. කුඩැල්ලා සෙමෙන් ගමනු කරනු ද, ගෙම්බා නිශ්චලව සිටිය ද ඌගේ යටිතල්ල නිතර උස් පහත්වනු ද දැකිය හැකි විය.

i) a) ඉහත විස්තරයේ සඳහන් සත්ත්වයින්ගේ **නිරීක්ෂණය කරන ලද** සජීවී බවේ මූලික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

b) ඉහත a) හි ඔබ සඳහන් කළ සජීවී බවේ ලක්ෂණ පෙන්නුම් කිරීමට අදාළ සත්ත්වයාට ආධාර වූ අවයවය / ව්‍යුහය කුමක් ද?

c) ගෙම්බාට හා කුඩැල්ලාට තෙතමනය සහිත දේහාවරණයක් පවත්වා ගැනීම වැදගත් වන්නේ ඇයි ?

d) තණකොළ පෙත්තාගේත්, කුඩැල්ලාගේත් මුඛය හැඩගැසී ඇත්තේ කුමන ආකාර ආහාර ගැනීම් ක්‍රියා සිදු කිරීමට ද?

ii) ඉහත ඡේදයේ විස්තර කළ ගෙවතු පරිසරයේ වෙසෙන පියවි ඇසට නොපෙනෙන වැදගත් ජීවී කොටසක් ලෙස ක්ෂුද්‍ර ජීවීන් හැඳින්විය හැකි ය. එම ක්ෂුද්‍ර ජීවීන්ගෙන් ඉටුවන වැදගත් කාර්යය කුමක් ද? (2010)